# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/A/AO/BC
ඔබේ අංකය / உமது இல. / Your No.:
Date: 2012.10.08

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**රජයේ නිලධාරීන් සඳහා නිල වාහන සැපයීම**

රජයේ නිලධාරීන් විසින් ඉන්ධන භාවිතය පිළිබඳව 2012 සැප්තැම්බර් 30 වන ඉරිදා දින රිවිර පුවත්පතේ පළ වූ ප්‍රවෘත්තිය කෙරේ ඔබගේ කාරුණිකව අවධානයට යොමු කරමි. (පිටපත අමුණා ඇත).

රජයේ නිලධාරීන් සඳහා නිල ප්‍රවාහන පහසුකම් ලබා දෙනුයේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හා 1999.10.08 දිනැති චක්‍රලේඛය හා ඉන් අනතුරුව මේ සම්බන්ධව නිකුත් කරන ලද චක්‍රලේඛවල විධිවිධාන අනුව ඒ සඳහා හිමිකම් ඇති නිලධාරීන් වෙතය.

එම නිල ප්‍රවාහන පහසුකම් හිමි නිලධාරීන්ට රජයේ වියදම් අවම කිරීමේ ක්‍රමවේදයක් ලෙස නිල වාහන සැපයීම වෙනුවට, 2008.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2008 අනුව, රු. 30,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවීමට හා අදාල තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාවක් ගෙවීමට රජය විසින් තීරණය කෙරිනි.

කෙසේ වෙතත්, මෙම ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවීම ක්‍රියාත්මක කිරීමේ දී, නිලධාරීන් විසින් මෙම පහසුකම මූල්‍ය ප්‍රතිලාභයක් ලැබෙන අයුරින් භාවිතා කරන බවත්, දීමනා ලබාගැනීමට අමතරව රජයේ සංචිත වාහන ද අයුතු ලෙස භාවිතා කරන බවත් අදාල ප්‍රවෘත්තියේ දැක්වේ. මෙම තත්ත්වය මෙයට පෙර ද මාධ්‍ය මගින් දක්වා තිබූ අතර, විවිධ වෘත්තීය සංගම් මගින් ද භාණ්ඩාගාරය වෙත පැමිණිලි කර ඇත.

එබැවින්, රාජ්‍ය නිලධාරීන් සඳහා තිල ප්‍රවාහන පහසුකම් සැපයීමේ දී පවත්නා චක්‍රලේඛයන්හි සඳහන් කොන්දේසි එපරිද්දෙන්ම ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම ප්‍රධාන ගණන්දීමේ හා අධීක්ෂණ නිලධාරීන් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ. එබැවින් මාස 3 කට වරක් හෝ අභ්‍යන්තර විගණනයන් මගින් මෙවැනි තත්වයන් පිළිබඳ නිතර විමසිලිමත් වන ලෙසත් ඉන් පෙන්වාදෙනු ලබන අඩුපාඩු නොවීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටින අතරම, රාජ්‍ය නිලධාරීන් සඳහා එල්ල වන අහිතකර විවේචනයන්ගෙන් මිදීම හා රජයේ වියදම් නිසිලෙස කළමනාකරණය කිරීම සඳහා ඔබගේ පුද්ගලික අධීක්ෂණය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

පී.ඒ. අබේසේකර
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති